00345

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**
**DEPARTMENT OF LEGAL STUDIES**
**LL.B DEGREE PROGRAMME – LEVEL 4**
**FINAL EXAMINATION – 2017/2018**
**LWU2314/ LLU4708- CONSTITUTIONAL LAW II**
**DURATION – THREE (03) HOURS**

---

**DATE: 05 March 2020** **TIME: 9.30 a.m. – 12.30 p.m**

---

Illegible handwriting will be penalized.
Total number of questions **08**.

Answer **Five (05)** questions only, selecting at least Two Questions (02) from each Part I and Part II.

## Part I

1) "…the modern State has an array of corporate entities which are formed by the State or on the directions of the State, to engage in a variety of activities including the provision of services, administration, manufacturing and commerce. Though these corporate bodies are legal persons in their own right and their legal identity is distinct from the State, they often operate in terms of State policy or are closely associated with the State or perform functions on behalf of the State or are largely controlled by the State or are financed by the State. In many cases, they conform to many or all of these characteristics. Frequently, the power and authority of the State lies behind these corporate bodies when they deal with the people. They are, in truth and fact, agencies or instrumentalities of the State which, therefore, must be held to be bound by Article 4 (d) of the Constitution, which requires all organs of the Government to respect, secure and advance the fundamental rights which are declared and recognized by the Constitution."

*Prasanna Jayawardena, PC,J in Captain Channa D.L. Abeygunewardena Vs Sri Lanka Port Authority (S.C. F.R. 57/2016, pp. 7 – 8)*

Discuss the scope and applicability of the term 'executive and administrative action' in Article 126 of the 1978 Constitution of Sri Lanka in the light of the above dictum.

(20 Marks)

ඉහත ප්‍රකාශය ඇසුරින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාවේ 'විධායක හා පරිපාලනමය ක්‍රියා' යන යෙදුමේ විෂය පථය හා අදාළත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

2) තිස්නව හැවිරිදි වඩු කාර්මිකයෙකු වන සමන්, ඔහුගේ බිරිඳ වන කුසුමා සහ ඔවුන්ගේ දරුවන් දෙදෙනා සමඟ කුරුණෑගල ප්‍රදේශයෙහි ජීවත් වූහ. පසුගිය සෙනසුරාදා දින සමන් රැකියාව සඳහා නිවසින් බැහැරව සිටියදී, පොලිස් නිලධාරියෙකු සමන්ගේ නිවසට පැමිණ එදින සවස 6.30ට පමණ විමර්ශණයක් සඳහා පොලිස් ස්ථානයට සමන් පැමිණිය යුතු බව ඔහුට දැනුම් දෙන ලෙස කුසුමාට දන්වා සිටින ලදි. සමන් නිවසට පැමිණි පසු, ඔහු කුසුමාද සමඟ පොලිසියට ගියේය. පොලිස් ස්ථානයේ දී ඔහුට දැනුම් දුන්නේ, කෙසෙල් කැනක් සොරකම් කර ඇති බවට ඔහුට එරෙහිව පැමිණිල්ලක් ගොනු කර ඇති බවයි. පැමිණිලිකරුවන් ඒ වන විට පැමිණ නොසිටි බැවින් සමන් සහ කුසුමාට පොලිස් ස්ථානයෙන් පිටව යන ලෙස පොලිස් නිලධාරියකු දැනුම් දෙන ලදි.

ඉහත සිදුවීමෙන් දින තුනකට පසු, කුරුණෑගල පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු සමන්ගේ නිවසට ඇතුළු වී ඔහුට සහ ඔහුගේ පවුලේ අයට අවමන් කළහ. ඉන්පසුව, පොලිස් නිලධාරීන් සමන්ව නිවසින් එළියට ඇද දමා කුසුමා සහ දරුවන් දෙදෙනා ඉදිරියේ ඔහුට කම්මුලට පහරක් ගැසුවේය. සමන්ගේ බිරිඳ තම සැමියා බේරා ගැනීමට ඉදිරිපත් වූ අතර ඇයව පොලිස් නිලධාරීන් විසින් තල්ලු කර දැමූ නිසා ඉන් ඇයට තුවාල සිදුවිය. පසුව, සමන්ව ජීප් රථයට තල්ලු කර දමන ලද අතර ජීප් රථය තුළදීද ඔහුට පහර දෙන ලදී.

එදිනම සවස, සමන්ගේ පියා සමන්ගේ සහෝදරයා වන සිරිපාල සමඟ කුරුණෑගල පොලිස් ස්ථානයට ගියහ. සමන්ට ඉතා දරුණු ලෙස පහර දී ඇති බව සමන්ගේ පියා සහ සහෝදරයා දුටු අතර සමන්ගේ අත ඉදිමී තිබුණ බැවින් ඔහුට ලබා දුන් තේ කෝප්පය පානය කිරීමට පවා නොහැකි විය. පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් සමන්ගේ පියා වෙත පැමිණ, පොලිසියෙන් පිටව යන ලෙසත් පසුදා උදැසන මහේස්ත්‍රාත් අධිකරණයට පැමිණෙන ලෙසත් ඉල්ලා සිටියහ.

කෙසේ වෙතත්, පසුදා උදෑසන සමන්ගේ පියා සිරිපාලද සමඟ උසාවියට යාමට පෙර පොලිසියට පැමිණියහ. අනෙක් සැකකරුවන් උසාවියට ගෙන යාමට පෙළ ගස්වා තිබෙනු ඔවුන් දුටු නමුත් එම පිරිස අතර සමන්ව දුටුවේ නැත. ඔවුන් සමන්ව සොයමින් පොලිසිය තුළට ගිය මුත් පොලිස් නිලධාරියෙකු ඔවුන්ට පැවසුවේ සමන් අසනීපයෙන් සිටින බවත් කුරුණෑගල රජයේ රෝහලට ඇතුළත් කළ බවත්ය. ඔවුන් රෝහලට ගියමුත් ඔවුන්ට සමන් සොයා ගැනීමට නොහැකි විය. මේ අතරතුර, පොලිතින් කවරයකින් හිස වසා රෝහලේ ට්‍රොලියක් මත වැතිරී තිබූ සමන්ගේ දේහය පියාට හමු විය.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කිරීම සඳහා කුසුමා ඔබගෙන් නීති උපදෙස් විමසා සිටී.

කුසුමාට උපදෙස් දෙන්න. අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන සහ නඩු නීතිය මගින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 20)

3) "…ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන ක්ෂය වීමකට හෝ පොසිලීකරණයට ලක් නොවූවද, අලුතෙන් මතුවෙමින් පවතින ගැටලු සහ අභියෝගයන්ට මුහුණ දීමට තරම් නම්‍යශීලී වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පනවන ලද මූලික අයිතිවාසිකමක් සම්බන්ධයෙන් වන විටදී වැඩි බලයකින් එය අදාළ වේ."

*Justice Bhagwati in Francis Coralie Mullin v. Administrator Union Territory of Delhi (A.I.R. 1981 S.C. 746.)*

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය සඳහා වන කාර්ය පටිපාටිමය අවශ්‍යතා සම්බන්ධයෙන් විනිසුරුවන් විසින් භාවිතා කරනු ලබන නූතන ප්‍රවේශයන් ඇසුරින් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 20)

4) සිවිල් වැසියන් තුන්සීයකට වැඩි පිරිසක් මිය ගොස් තවත් වැසියන් පන්සීයකට පමණ තුවාල සිදුකරමින් රටේ ආගමික සිද්ධස්ථාන කිහිපයක සිදුවූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මාලාවකින් පසුව ග්‍රීන්ලැන්ඩ් රාජ්‍යයේ විධායක ජනාධිපති වන සූරිය මහතා විසින් හදිසි නීති රෙගුලාසියක් මගින් සම්පූර්ණ මුහුණ ආවරණය කිරීම තහනම් කළේය. ජනාධිපතිවරයා මෙම තීරණය ගෙන ඇත්තේ ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා සහ සාමකාමී හා සහජීවනයෙන් යුත් සමාජයක් නිර්මාණය කිරීමේ අරමුණින් ය. ඉස්ලාම් ආගමික කාන්තාවන් දෙදෙනෙකු වන ෆාතිමා සහ ෆ්‍රීසා පැමිණිලි කර සිටියේ ශරීරය සහ මුහුණ යන දෙකම ආවරණය වන ලෙස පළඳිනු ලබන මුස්ලිම් කාන්තාවන්ගේ සාම්ප්‍රදායික ඇඳුම වන බුර්කාව පැළඳීම එම රෙගුලාසිය මගින් තහනම් කිරීම නිසා ඔවුන්ගේ පෞද්ගලික නිදහස බලපෑමට ලක්ව ඇති බවයි.

මේ අතර, ග්‍රීන්ලැන්ඩ් හි උතුරු පළාතේ ජාතික පාසලක් වන හින්දු විද්‍යාලයේ විදුහල්පතිගේ ප්‍රධානත්වයෙන් යුත් කළමනාකරණ කමිටුව සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට අබායා ඇඳීම තහනම් කරමින් ලිපියක් නිකුත් කළේය (අබායා ; මුහුණ, පාද සහ අත් හැර මුළු සිරුරම ආවරණය කරයි ). හින්දු විද්‍යාලයේ මුස්ලිම් ගුරුවරියක වන නුස්ලාගේ සාමාන්‍ය ඇඳුම වන්නේ අබායාවයි. ලිපිය නිකුත් කිරීමෙන් පසුදින නුස්ලා අබායා ඇඳගෙන පාසලට පැමිණි අතර පාසලේ ආරක්ෂක නිලධාරියා විසින් ඇයව පාසලට ඇතුළුවීම වලක්වනු ලැබීය. එසේම, ගේට්ටුව වටා එක්රැස් ව සිටි දෙමව්පියන් ඇයව වට කරගන්නා ලදි. ඔවුන් ඇයට හිරිහැර කිරීම සඳහා අසභ්‍ය වචන භාවිතා කළ අතර ඇගේ අත්බෑගය සහ කුඩය උදුරා ගැනීමට උත්සාහ කළහ.

ග්‍රීන්ලැන්ඩ් හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවට සමාන යැයි උපකල්පනය කරමින් ෆාතිමා, ෆ්‍රීසා සහ නුස්ලා ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත්දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

<u>දෙවන කොටස</u>

5) "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයේ මූලික පරමාර්ථය වන්නේ අව්‍යාජ ස්වාධිකාරයක් භුක්ති විඳින දේශපාලන පුද්ගලයෙකු ලෙස දේශපාලන ප්‍රජාවේ සෑම සාමාජිකයෙකුම ආරක්ෂා කිරීමයි."

*Carl Friedrich*

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඉහත ප්‍රකාශයට කිසියම් වලංගු භාවයක් ඇත්දැයි ඔබ සිතන්නේද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය නම් සංකල්පයේ වැදගත් ලක්ෂණ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා එහි ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 20)

6) ශ්‍රී ලංකාවේ X නම් පළාත් සභාව විසින් පරිසරය ආරක්ෂා කිරීම, කළමනාකරණය සහ වැඩිදියුණු කිරීම සඳහාත් පරිසරයේ ගුණාත්මකභාවය නියාමනය කිරීම, නඩත්තු කිරීම සහ පාලනය කිරීම සඳහාත් පළාත තුළ ප්‍රතිපාදන සැලසීමට පළාත් පාරිසරික අධිකාරියක් පිහිටුවීම සඳහා වෙනම පාරිසරික ප්‍රඥප්තියක් සම්මත කිරීමට සැලසුම් කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පරිසරයට අදාළ විධිවිධාන පහත පරිදි වේ.

<u>පළාත් සභා ලැයිස්තුවේ 37 වන අයිතමය</u>

පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මඟින් හෝ නීතියක් යටතේ අවසර දී ඇති ප්‍රමාණයට, පළාත ඇතුළත පරිසරය ආරක්ෂා කිරීම.

<u>සමගාමී ලැයිස්තුවෙ 33 වන අයිතමය</u>

පරිසරය ආරක්ෂා කිරීම

පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීමට මධ්‍යම රජය දැනටමත් 1980 අංක 47 දරණ ජාතික පරිසර පනත යටතේ (සංශෝධිත) මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවා ඇත.

X පළාත් සභාවට වෙනම පළාත් පාරිසරික ප්‍රඥප්තියක් සම්මත කර ගත හැකිද යන්න සම්බන්ධව X පළාත් සභාව ඔබගෙන් නීති උපදෙස් විමසා සිටියි. ඔබ ලබා දෙන උපදෙස් මොනවාද? සාකච්ඡා කරන්න. (ලකුණු 20)

7) "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආණ්ඩුකාරවරයා පළාතක ජනතාවගේ මැතිවරණ අපේක්ෂාවන්ට ගරු කරන බවත්, මහ ඇමතිගේ උපදෙස් මත ක්‍රියා කරන බවත් සහතික කෙරේ. ඔහුට එවැනි උපදෙස් අතහැර දැමිය හැකි වන්නේ මහ ඇමතිවරයා සභාවේ බහුතර විශ්වාසය භුක්ති විඳීම අවසන් කරන විටදීය. මෙය ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමේ ගුණාත්මකභාවය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට අපේක්ෂා කරන ඉතා සතුටුදායක විධිවිධානයක් වේ."

Felix, S. (2013). 'The Dissolution of Provincial Councils- A Comparative Analysis', in Marasinghe, J. & Wickramaratne, L.(ed) 13th Amendment: Essays on Practice, p.205

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පළාත් සභාවල විධායක බලතල සැලකිල්ලට ගනිමින් ඉහත ප්‍රකාශයේ වලංගුභාවය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

අදාළ නීති අධිකාරීන් සහ උදාහරණ සමඟ ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 20)

8) දීර්ඝ කාලයක් තිස්සේ පළාත් සභා ක්‍රමය මහජන විවේචනයට ලක්ව ඇති බැවින් ශ්‍රී ලංකාවේ පළාත් සභා පද්ධතියේ වාසි සහ දුර්වලතා තක්සේරු කිරීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය තීරණය කර තිබේ. එමනිසා, 'ශ්‍රී ලංකාවේ පළාත් සභාවල ඵලදායීතාවය' පිළිබඳ ඔබේ මතය ඉදිරිපත් කරන ලෙසට අමාත්‍යාංශය ඔබෙන් ඉල්ලීමක් කර තිබේ. පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් අමාත්‍යාංශයට වාර්තාවක් ලියන්න.

අ) පළාත් සභාවල ව්‍යවස්ථාදායක බලය

ආ) පළාත් සභාවල විධායක බලය

ඇ) පළාත් සභාවල අධිකරණ බලය

අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු මගින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 20)

***නිමිකම් ඇවිරිණි***